# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2138/1 - 2019 අගෝස්තු මස 26 වැනි සඳුදා - 2019.08.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2ඇ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත කාමර 34 කින් යුත් කළමැටිය කබානා හෝටල් ව්‍යාපෘතිය- කළමැටිය පාර, හාතගල, හුංගම
පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව

1988 අංක 64 හා අංක 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව බලංගොඩ, වගපිටිය අංක 383ඒ ලිපිනයේ ඒ. එල්. ඒ. සී. රත්නපාල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජිත කාමර 34කින් යුත් කළමැටිය කබානා හෝටල් ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව 8.30 සිට ප.ව 4.15 දක්වා 2019.08.26 දින සිට දින 30 ක කාලයක් සඳහා තබා ඇත.(සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

| | | |
|---|---|---|
| 1. | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | 4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. |
| 2. | මධ්‍යම පරිසර අධිකාරිය | අංක 104, පරිසර පියස, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල. |
| 3. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අංක 811/1 ජයන්තිපුර මාවත, බත්තරමුල්ල. |
| 4. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අම්බලන්තොට. |
| 5. | ප්‍රාදේශීය සභාව | අම්බලන්තොට. |
| 6. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් කාර්යාලය, තංගල්ල. |
| 7. | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | ප්‍රාදේශීය කාර්යාලය, පරිපාලන සංකීර්ණය, හම්බන්තොට. |


1A - G 30771 - 27 (2019/08)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මෙම යෝජිත හෝටල් ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳව ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2019.08.26 දින සිට දින 30ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
අධ්‍යක්ෂ ජනරාල්/ වෙරළ සංරක්ෂණ සහ
වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහ ලේකම් කාර්යාලය, 4 වන මහල
මාලිගාවත්ත, කොළඹ 10.
දුරකථන අංක : 011-2449754,011-2387922,011-2449197.
ෆැක්ස් අංක : 011-2438005,011-2472623.

09 - 57

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.